**ශීර්ෂය - 225 ශ්‍රී ලංකා පොලීසිය**
---------------------------------

1. **මූල්‍ය ප්‍රකාශන**
------------------

**1.1** **තත්ත්වාගණනය කළ මතය**
-------------------------------

ශ්‍රී ලංකා පොලිසියේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11 (1) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා පොලිසියේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුලත් සම්පිණ්ඩන වාර්තාව 2022 ජුනි 08 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11 (2) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා පොලීසියට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 ජුලි 19 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා පොලිසියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2** **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**
----------------------------------------------

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී .ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම**
-----------------------------------------------------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා පොලීසිය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38 (1) (ඇ) උප වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා පොලීසියේ  මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදුකර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

### 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

------------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුලත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ.  සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත.  වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්  ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික  තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී.  මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී.  වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි  හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගණුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව  ගණන්දීමේ නිලධාරි දැනුවත් කරන ලදී.

### 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

-----------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (I) (ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට.

(ආ) ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන  පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.**

| විගණන නිරීක්ෂණය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) දේපල පිරියත හා උපකරණ 2021 වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබූ මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශනයේ දේපල පිරියත හා උපකරණ වර්ෂය අග වටිනාකම ACA - 6 අනුව රු.52,247,996,562 ක් වූ අතර 2021 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර වත්කම් වාර්තාව අනුව වටිනාකම රු.51,491,465,387 ක් වූයෙන් රු.756,531,175 ක වෙනසක් නිරීක්ෂණය විය. | මෙම වෙනස නිවැරදි කිරීමට කටයුතු කරණු ලැබේ. | මෙම වෙනස්කම් අනාවරණය කර ගත යුතු අතර කඩිනමින් නිවැරදි කළ යුතුය. |
| (ආ) රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් පාලන ගිණුම අනුව දෙසැම්බර් 31 දිනට ශේෂය රු.779,845,975 ක් වූ අතර එදිනට කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ මුළු එකතුව රු.699,035,536 ක් විය. ඒ අනුව රු.80,810,439 ක වෙනසක් නිරීක්ෂණය විය. එම වෙනස හඳුනාගෙන අවශ්‍ය ගැලපීම් කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙම වෙනස වාර්ෂිකව අඩු කිරීමට කටයුතු කර ඇත. ණය ශේෂ සටහන් කිරීමේ දෝෂ, අත්හැරීම් දෝෂ සිදුවී ඇති අතර 2015 වර්ෂය දක්වා වසර 06 කට අදාලව මෙම අත්හැරීම් හා වරදවා සටහන් කිරීම් හඳුනාගෙන නිවැරදි කිරීමට කටයුතු කර ඇත. | වෙනස්කම් හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කල යුතුය. |
| (ඇ) මූල්‍ය ප්‍රකාශ සමඟ ඉදිරිපත් කළ බැඳීම් ප්‍රකාශය සටහන (iV) අනුව වෛද්‍ය සැපයුම් කොට්ඨාශය වෙත පියවීමට ඇති බැරකම් වටිනාකම රු.38,358,226 ක් වුවද නාරාහේන්පිට පොලිස් වෛද්‍ය සේවා කොට්ඨාශයේ ලේඛනවලට අනුව 2021 දෙසැම්බර් 31 දිනට බැරකම් ශේෂය රු.45,404,844 ක් වූ බැවින් රු.7,046,618 ක වෙනසක් නිරීක්ෂණය විය. | පසුව පිළිතුරු ඉදිරිපත් කරමි. | බැරකම් ශේෂය නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |

**2.** **මූල්‍ය සමාලෝචනය**

**2.1** **වියදම් කළමනාකරණය**

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.**

| විගණන නිරීක්ෂණය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මූලධන වැය විෂයයන් 04 ක් වෙත සලසා තිබූ රු.891,580,000 ක් වූ මුළු ශුද්ධ පතිපාදනයම ඉතිරි වී තිබුණි. මෙම ඉතිරිවීම් තුල රු.38,000,000 ක් වූ පරිපූරක ප්‍රතිපාදනයක්ද විය. | ජීප් රථ මිලදී ගැනීම, නිල සුනඛයින් මිලදි ගැනීම ආදිය යටතේ වූ වියදම් ඉතිරි විය. | ප්‍රතිපාදන උපරිම කාර්යක්ෂමතාවයකින් උපයෝජනය කල යුතුය. |
| (ආ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට වර්ෂ 2 ක් ඉක්මවූ තැන්පත් ගිණුම් ශේෂ වටිනාකම රු. 232,581,722 ක් විය. මේ අතර 2013 වර්ෂයේදී සාර්ක් ත්‍රස්තවාදී හා මත්ද්‍රව්‍ය වැරදි නිරීක්ෂණ මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා ඉන්දියාවෙන් ලබා දී තිබුණු රු. 11,503,192 ක මුදලක් අදාල කාර්යයන් ඉටු නොකර වසර 08 කට වැඩි කාලයක් තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි. | 2013 වර්ෂයේ ස්ථාපිත කළ දත්ත පද්ධතියේ අඩුපාඩු සැකසීම සඳහා මෙම මුදල් භාවිතා කිරීමට ඉන්දියානු රජයේ අනුමැතිය ඉල්ලා ඇති නමුත් මෙතෙක් අනුමැතිය නොලැබීම නිසා මෙම ශේෂය තැන්පත් ගිණුමේ පවතී. | අදාල අරමුණු සඳහා ප්‍රතිපාදන උපයෝජනය කල යුතුය. |
| **(ඇ)** විගණනයට ඉදිරිපත් කල සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය අවසානයේ අයවීම් හිඟ හිට නිලධාරීන් 3,015 ක ගෙන් අයවිය යුතු ශේෂ වල එකතුව රු.68,019,289 ක් වූ අතර එයින් වර්ෂ 05ට වැඩි හිඟ හිටි ණය ශේෂවල එකතුව රු.46,756,018 ක් විය. එම හිඟ හිටි ණය ශේෂ අයකර ගැනීමේ පසු විපරම් කටයුතු දුර්වල තත්වයක පැවතුණි. | 2021 වර්ෂය තුල වසර 05 ට වැඩි හිඟ හිටි ශේෂයන්ගෙන් රු.5,637,218 ක් අයකර ගැනීමෙන් පසු වර්ෂය අවසානයේ වසර 05 ට වැඩි හිඟ හිටි ණය ශේෂ එකතුව රු.46,756,018 ක් විය. | හිඟ හිටි ශේෂයන් අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |

3. **මෙහෙයුම් සමාලෝචනය**

3.1 **අපේක්ෂිත නිමැවුම් මට්ටම ලබා නොගැනීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) 1865 අංක 16 දරණ පොලිස් ආඥා පනත සංශෝධනය කිරීමේ අවශ්‍යතාවය 2014 වර්ෂයේදී හඳුනාගෙන තිබුණි. සංශෝධන සිදුකල යුතු ක්ෂේත්‍ර 16 ක් ද හඳුනාගෙන තිබුණි. වර්තමාන හා අනාගත සමාජීය හා තාක්ෂණික සංවර්ධන අවශ්‍යතාවයන්ට ගැලපෙන අයුරින් යාවත්කාලීන කර සංශෝධනය කිරීම සඳහා 2014 නොවැම්බර් 19 වන දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ද ලැබී තිබුණ ද 2022 මැයි මාසය වන විටත් පනත සංශෝධනය වී නොතිබුණි. | පොලිස් ආඥා පනත සංශෝධනය කිරීම සඳහා යෝජිත කෙටුම්පත සහ සංකල්ප පත්‍රිකාව 2022.04.10 දින අමාත්‍යාංශය වෙත යොමු කර ඇත. | හඳුනාගත් ක්ෂේත්‍රයන්ට අදාලව පනත සංශෝධනය කළ යුතුය. |
| (ආ) ශ්‍රී ලංකා පොලීසියේ තත්කාලීනව පවත්නා අඩුපාඩු හා දුර්වලතා හඳුනාගෙන නිසි පරිදි යාවත්කාලීන කිරීමට යෝජනා ඉදිරිපත් කිරීමටත් අනාගතයේ යහපත් සහ කාර්යක්ෂම පොලිස් සේවාවක් රටතුළ ස්ථාපිත කිරීම සඳහා අවශ්‍ය සැලසුම් සකස් කිරීමේ අරමුණින් පිහිටුවා තිබූ කමිටුවේ වාර්තාව "පොලිස් ප්‍රතිසංවිධාන ක්‍රියාකාරී සැලැස්ම" ලෙස 2017 මැයි 31 දින එළිදක්වා තිබුණද 2022 මැයි දක්වා ක්‍රියාත්මක කර නොතිබුණි. | පොලිස් ප්‍රතිසංවිධාන සැලැස්ම සංශෝධනය කිරීම සඳහා කමිටුවක් පත්කර ඇති අතර එම කමිටුව රැස්වී මෙම සංශෝධන කිරීම සඳහා ක්‍රියාමාර්ග ගනිමින් සිටී. | හඳුනාගෙන ඇති ප්‍රතිසංවිධාන කටයුතු සිදුකළ යුතුය. |
| (ඇ) දඩමුදල් අයකරගැනීම වේගවත් කිරීමත් රජය ආදායමට එකතුවන දඩ මුදල් ප්‍රමාණය ඉහල නැංවීමත් මහජනයාට දඩ මුදල් ගෙවීම පහසු කිරීමත් අරමුණින් රථ වාහන වැරදි සඳහා ස්වයංක්‍රීයව දඩ මුදල් | ICTA ආයතන මගින් අවශ්‍යතා ගුණාංග (Requirement) අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇත. සුදුසු පාර්ශවයන් තෝරා ගන්නා තෙක් තැපැල් දෙපාර්තමේන්තුවට අවසර දීමට සුදුසු බවට ඒකාබද්ධ කැබිනට් | හඳුනාගත් අරමුණු ඉටුවන ආකාරයට ස්වයංක්‍රීය දඩ මුදල් ගෙවීමේ ක්‍රමවේදයක් ස්ථාපිත කිරීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| ගෙවීමේ ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම සඳහා 2014 වර්ෂයේ සිට සැලසුම් කරමින් පැවතියද 2022 ජුනි දක්වා අදාල ක්‍රමය ස්ථාපිතව නොතිබුණි. | පත්‍රිකාවක් ඉදිරිපත් කිරීමට 22.05.04 තීරණය විය. | |
| (ඇ) 2019 අංක 10 දරණ මෝටර් වාහන (සංශෝධන) පනත මගින් හඳුන්වා දුන් මෝටර් රථ වාහන වැරදි සිදුවන වාර ගණන අනුව දඩ මුදල් අයකිරීමේ ක්‍රමය ක්‍රියාත්මක කිරීම 2019 ජුනි 20 දින සිට ක්‍රියාත්මක නමුත් රථවාහන වැරදි සම්බන්ධයෙන් වරදකරුවන් එකම වරද සිදුකරන වාර ගණන පැහැදිලිව හඳුනාගත හැකි පරිදි දත්ත පරිගණක ගත කිරීමේ ක්‍රමයක් ශ්‍රී ලංකා පොලීසිය ක්‍රියාත්මක නොකිරීම නිසා එකම වරද කිහිප අවස්ථාවක් සිදුකරන වරදකරුවන් ගෙන් නිවැරදි දඩ මුදල අයකර ගැනීමට නොහැකි වී තිබුණි. | ICTA ආයතනය ඉදිරිපත් කල ක්‍රමවේදය තුල නිවැරදි දඩමුදල් අයකර ගැනීමේ හැකියාව ලැබෙනු ඇත. වරද වැඩිවන වාර ගණන අනුව දඩමුදල් අය නොකිරීම නිසා රජයට වාර්ෂිකව සැලකිය යුතු මූල්‍යමය පාඩුවක් සිදුවන බව නිරීක්ෂණය වේ. | රථවාහන නීති කඩකරන වැරදිකරුවන් එම වරද සිදුකරන වාර ගණන හඳුනාගත හැකි පරිගණක දත්ත පද්ධතිය ස්ථාපිතකර ඒ අනුව නියමිත දඩ මුදල් අයකිරීමට කටයුතු කළ යුතුය. |

## 3.2 ප්‍රසම්පාදනයන්

-----------------

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.**

| **විගණන නිරීක්ෂණය** | **ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| (අ) පොලිස් සැරයන් හා පොලිස් කොස්තාපල් නිලධාරීන් සඳහා හිස්වැසුම් 75,000 ක් රු.93,455,119 කට මිලදී ගැනීමට 2011 වර්ෂයේ ආරම්භ කර තිබූ ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී සිදුව තිබූ අවිධිමත් කරුණු නිසා බේරුම්කරණයේදී 2017 ජනවාරි 21 දින ලබා දී තිබූ තීන්දුව වූ හිස්වැසුම් 75,000 සඳහා වූ මුදල සහ ඒ සඳහා වන අනෙකුත් ගාස්තු ගෙවීම ශ්‍රී ලංකා පොලීසිය විසින් ප්‍රතික්ෂේප කරමින් අඛණ්ඩව අධිකරණ ක්‍රියාමාර්ගයක යෙදී | ගෙවීම් සඳහා අවශ්‍ය අමතර ප්‍රතිපාදන ලබා නොදීම නිසා ප්‍රමාදවීම තුලින් රජයට විශාල පිරිවැයක් දැරීමට සිදුවන බව සඳහන් කර අමාත්‍යාංශ ලේකම් වෙත ලිපියක් යොමුකර ඇත. | මෙම ප්‍රසම්පාදන හා බේරුම්කරණ ක්‍රියාවලියේ අඩුපාඩු මත රජයට දැරීමට සිදුවන අමතර වියදම් සම්බන්ධයෙන් වගකිව යුත්තන් හදුනා ගැනීමට විධිමත් පරීක්ෂණයක් පැවැත්විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | තිබුණි. 2020 අගෝස්තු මාසය වන විට මෙම හිස්වැසුම් මිලදී ගැනීම සඳහා රු.191,768,632 ක් ද අනෙකුත් ගාස්තු ලෙස රු.45,316.880 ක් ද ගෙවීමට නියමිතව තිබුණි. 2022 ජූනි මාසය වන විටත් අධිකරණ කටයුතු අවසන්ව නොතිබුණු අතර සැපයුම් කරුගේ ගබඩා ගාස්තු, නීති ගාස්තු හා විනිමය අනුපාත වැඩිවීමේ අවාසියද ශ්‍රී ලංකා පොලීසිය දැරිය යුතුබවට සැපයුම්කරු ඉල්ලා තිබුණි. මේ සම්බන්ධයෙන් වගකිවයුතු පාර්ශවයන් හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි. | | |
| (ආ) | පොලීසියේ රාජකාරී ඉටු කිරීමට නව ජීප්රථ මිලදී ගැනීමේ අවශ්‍යතාවය හඳුනාගෙන 2018 අගෝස්තු 08 දින අමප/18/1650/828/10-1 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ජීප් රථ 750 ක් (විශේෂ කාර්ය බලකාය සඳහා ජීප්රථ 150 ක් ඇතුළුව) රු. මිලයන 14,100 කට ඉන්දියානු ණය යෝජනා ක්‍රමය (Indian Line of Credit) යටතේ මිලදී ගැනීමට සැලසුම් කර තිබුණි. වසරකට ජීප් රථ 250 බැගින් වසර 03ක් තුල මිලදී ගැනීමට සැලසුම් කළ ද මීට අදාල ප්‍රසම්පාදන කටයුතු 2022 ජූනි මාසය වන විටත් අවසන්ව නොතිබුණි. | මෙම ව්‍යාපෘතියට අදාල ප්‍රසම්පාදන කටයුතු ආරම්භකර ඇති අතර ඉන්දියානු Exin බැංකුව වෙතින් ලබා දුන් නිර්දේශයන්ට අනුව ප්‍රසම්පාදන ලංසු කැඳවීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී. | අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට ප්‍රසම්පාදන ක්‍රියාවලිය කඩිනම් විය යුතුය. |
| ඇ) | පොලිස් මූලස්ථානයේ නව මහලේකම් ගොඩනැගිල්ලේ අළුත්වැඩියාවක් හේතුවෙන් එහි අංශ කිහිපයක් පවත්වාගෙන යාමට වර්ග අඩි 70,000 කින් යුත් ගොඩනැගිල්ලක් වසර 02 ක් සඳහා 2021 ජනවාරි මස සිට රු.234,600,000 (Vat රහිත) ක් වූ බදු මුදලකට ලබාගෙන තිබුණි. මෙහි වාහන නැවැත්වීම සඳහා ගොඩනැගිල්ලෙන් පිටත භූමියක් නොතිබූ අතර මහල් 06 ක් රථ ගාල ලෙස භාවිතා කරනු ලබන අතර අදාල වාහන ඉහල, පහල රැගෙන යාමට අධික විදුලි පිරිවැයක් දැරීමට සිදුව තිබුණි. බිම් මහල ඇතුළු මහල් 03 ක | ගොඩනැගිල්ලට අදාල සැලසුම් සකස් කිරීමේදී වාහන ගාල් කිරීම සඳහා නවීන තාක්ෂණික ක්‍රම උපයෝගී කරගෙන ඇත. බිම්මහලේ අතුරු මහලක්ද, ඉහල මහලද ප්‍රයෝජනයට ගත හැකි අයුරින් සකස්කර දෙන ලෙසට කරන ලද ඉල්ලීම් මත හිමිකරු කටයුතු කරමින් පවතී. අළුත් වැඩියා අවසාන වූ වහාම ප්‍රධාන පිවිසුම් ප්‍රයෝජනයට ගත හැක. අනුකූලතා සහතිකය ලබාදෙන ලෙස හිමිකාර පාර්ශවයට දැනුම් දී ඇත. | ගොඩනැගිලි කුලියට ගැනීමේදී පොදු පහසුකම් හා මාසික පුනරාවර්තන වියදම් පිළිබඳ ප්‍රමාණවත් අවධානයක් යොමුකල යුතුය. |

| | | |
|---|---|---|
| ඉදිකිරීම් අවසන්ව නොතිබූ අතර සිදුකරමින් පැවති අමතර ඉදිකිරීම් සඳහා ගොඩනැගිල්ලේ සාමාන්‍ය විදුලි සැපයුම භාවිතාකර තිබුණි. ගොඩනැගිල්ලේ ප්‍රධාන පිවිසුම 2022 මාර්තු මාසය වන විටත් භාවිතයට ගත නොහැකිව තිබූ අතර ගොඩනැගිල්ලේ අනුකූලතා සහතිකය (COC) විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | | |
| (ඇ) හබරාදුව "නිල සෙවණ" යෝජනා ක්‍රමයෙන් නිවසක් රු. මිලියන 3.8 බැගින් රු. මිලියන 729.6 කට නිවාස 192 ක් මිලදී ගැනීමට 2017 දෙසැම්බර් 29 දින ගිවිසුමකට එළඹ තිබුණි. 2019 අප්‍රේල් 02 දින වන විට රු.මිලියන 500 ක අත්තිකාරම් ගෙවා තිබුණ අතර අදාල පොදු පහසුකම් ද ඇතුළුව නිවාස 192 ක් පවරාගැනීමේ කටයුතු නිරවුල්ව නොතිබුණි. | මෙම ගිවිසුම සඳහා පාර්ශව තුනක් සම්බන්ධවී ඇති හෙයින් ශ්‍රී ලංකා පොලීසියට පමණක් තීරණයක් ගත නොහැක. අමාත්‍යාංශ ලේකම්තුමාගේ උපදෙස් පරිදි ඉදිරි ක්‍රියා මාර්ග ගැනීමට කටයුතු කරමි. | මෙම නිවාස පවරා ගැනීමේදී ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඉ) නාරාහේන්පිට පොලිස් ප්‍රවාහන කොට්ඨාශයේ ප්‍රධාන ගරාජය ජාලගත කිරීමට අදාලව වාහන කළමනාකරණ පද්ධතියක් ස්ථාපිත කිරීමට 2017 මාර්තු 17 දින රු.12,297,829 ක මුදලකට ගිවිසුම් ගතව තිබුණි. ගිවිසුම්ගත දින සිට වර්ෂ 05 ක් ඉක්ම ගියද, මෙම පද්ධතියෙන් අපේක්ෂිත කාර්යය ඉටුකර ගැනීමට අපොහොසත්ව තිබුණි. | පසුව පිළිතුරු ඉදිරිපත් කරමි.. | වාහන කළමනාකරණ පද්ධතියෙන් අපේක්ෂිත අරමුණු ළඟාකර ගැනීමට අප්‍රමාදව කටයුතු කළ යුතුය. |

3.3 **වත්කම් කළමනාකරණය**

**-----------------------------**

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ**

| **විගණන නිරීක්ෂණය** | **ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| (අ) 2008 මාර්තු 19 දින උසස් පුහුණු පොලිස් විද්‍යාලය සහ ඉංගිරිය පොලිස් ස්ථානය ඉදිකිරීම සඳහා වැඩ ආරම්භකර 2018 වර්ෂය අවසාන වන විට රු.8,895,273 ක් වැයකර තිබුණද ඉදිකිරීම් අතරමග නැවතී තිබුණි. 2008 වර්ෂයේ පොලීසියට පවරා දී තිබූ අක්කර 06 ක මෙම භූමියද නිරවුල්කර ගැනීමෙන් තොරව පැවතුණි. | රුවන්පුර අධිවේගී මාර්ගය සඳහා ඉඩමෙන් කොටසක් ලබා දීමට සිදුව ඇත. එමෙන්ම මෙම ව්‍යාපෘතිය ඉදිරියට කරගෙනයාමට ඇති හැකියාව සම්බන්ධයෙන් විශේෂඥ වාර්තාවක් කැඳවීමට කටයුතු කර ඇති අතර අදාල වාර්තාව ලැබීමෙන් අනතුරුව ඉදිරි කටයුතු සිදු කිරීමට නියමිතය. | උපරිම කාර්යක්ෂමතාවයෙන් වත්කම් උපයෝජනය කළ යුතුය. |
| (ආ) පොලිස් අධ්‍යයන ආයතනයක් ස්ථාපිත කිරිමට මල්වාන පිහිටි අක්කර 12 රූඩ් 01 පර්චස් 08 ක් වූ ඉඩම ශ්‍රී ලංකා පොලීසියට පවරා දීම සඳහා 2017 ජුනි මස 20 දින අමාත්‍ය මණ්ඩලය අනුමැතිය ලබා දී තිබුණද 2022 ජුනි මස වන විටත් ඉඩම පවරාගෙන නොතිබුණි. | පසුව පිළිතුරු සපයමි. | ඉඩම පවරා ගැනීම කඩිනමින් අවසන් කළ යුතුය. |
| (ඇ) සපුගස්කන්ද පොලිස් ස්ථානය පිහිටි අක්කර 4 ක ඉඩමෙන් අක්කර දෙකක පමණ භූමියක් 1981 වර්ෂයේ සිට ඌන උපයෝජිතව පැවතුණි. | මෙම භූමියෙහි පොලිස්පති ගබඩාව ඉදි කිරීම සඳහා අවශ්‍ය සැලසුම් කටයුතු ආරම්භ කර ඇත. | උපරිම කාර්යක්ෂමතාවයෙන් වත්කම් උපයෝජනය කළ යුතුය. |
| (ඈ) නාරාහේන්පිට පොලිස් රෝහල පුළුල් කිරිම සඳහා 2018 වර්ෂය අවසාන වන විට රු. මිලියන 334 ක් වැය කර ඉදිකරන මහල් 6 කින් සමන්විත ගොඩනැගිල්ලේ මහල් 4 ක් 2022 ජුනි මාසය වන විටත් ඌන උපයෝජිතව පැවතුණි. | ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් නොසිටීම නිසා මෙම ගොඩනැගිල්ල ඌන උපයෝජිතව පවතී. කාර්ය මණ්ඩලය බඳවාගත් පසු නව ගොඩනැගිල්ල පූර්ණ ලෙස භාවිතා කිරීමට කටයුතු කරනු ලැබේ. | උපරිම කාර්යක්ෂමතාවයෙන් වත්කම් උපයෝජනය කළ යුතුය. |

## 3.4 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ

| විගණන නිරීක්ෂණය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂය තුල කාන්තාවන්ට එරෙහි බල අපරාධ සිද්ධි 567 ක් වාර්තා වී තිබූ අතර වර්ෂය අවසාන වන විට එයින් සිද්ධි 355 කට අදාලව විමර්ශන අවසන්ව නොතිබුණි. වැඩිම සිද්ධි ප්‍රමාණයක් වාර්තා වී තිබුණේ ස්ත්‍රී දූෂණය, බරපතල තුවාල සිදු කිරීම හා මිනී මැරීම සම්බන්ධයෙන් විය. එම අපරාධ වලට අදාල සිද්ධි පිළිවෙලින් 186 ක්, 194 ක් හා 79 ක් වූ අතර විසඳීමේ ප්‍රතිශතය පිළිවෙලින් සියයට 43 සියයට 35 හා සියයට 30 මට්ටමේ විය. වර්ෂය තුල කාන්තාවන් ඝාතන සිද්ධි 79 ක් වාර්තා වී තිබූ අතර වර්ෂය අවසාන වන විට 55 ක් තවදුරටත් විමර්ශන මට්ටමේ පැවතුණි. | මේ වන විට විසඳීමේ ප්‍රතිශතය මීට වඩා ඉහල අගයක් ගත යුතුය. | කාන්තාවන්ට එරෙහි බල අපරාධ සිද්ධි සම්බන්ධ විමර්ශන අවසන් කිරීමට කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) ළමයින්ට එරෙහි බල අපරාධ සිද්ධි 3,183 ක් වර්ෂය තුල වාර්තා වී තිබූ අතර එයින් සිද්ධි 1,876 කට අදාලව එනම් සියයට 59 කට අදාලව විමර්ශන අවසන්ව නොතිබුණි. ඒ යටතේ වැඩිම සිද්ධි වාර්තා වී තිබුණේ ස්ත්‍රී දූෂණය, අපහරණය හා බරපතල ලිංගික අපයෝජනය යන සිද්ධි සම්බන්ධයෙන් විය. එම අපරාධවලට අදාල සිද්ධී පිළිවෙලින් 1,780 ක් 611 ක් හා 580 ක් වූ අතර විසඳීමේ ප්‍රතිශතය පිළිවෙලින් සියයට 44, සියයට 30 හා සියයට 43 තරම් අඩු ප්‍රතිශතයක පැවතුණි. ළමයින්ට එරෙහි මිනී මැරීම් සම්බන්ධ සිද්ධි 27 ක් වාර්තා වී තිබූ අතර වර්ෂය අවසානය වන විට 19 ක් තවදුරටත් විමර්ශන මට්ටමේ පැවතුණි. | මේ වන විට විසඳීමේ ප්‍රතිශතය මීට වඩා ඉහල අගයක් ගත යුතුය. | ළමයින්ට එරෙහි අපරාධ විසඳීමට කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ)රථවාහන පාලනය හා මාර්ග ආරක්ෂාව පිළිබඳ කොට්ඨාශයේ තොරතුරු අනුව 2020 වර්ෂයේදී 2,242 ක් වූ මාරක රිය අනතුරු සංඛ්‍යාව 2021 වර්ෂයේදී 2,414 ක් දක්වා වැඩිවී තිබුණි. ඊට අනුරූපව මියගිය සංඛ්‍යාවද 2,363 සිට 2,513 දක්වා වැඩිවී තිබුණි. මාරක අනතුරු සංඛ්‍යාව හා එම අනතුරුවලින් මියගිය සංඛ්‍යාව 100 ඉක්මවූ පොලිස් කොට්ඨාශ ලෙස අනුරාධපුරය, කුරුණෑගල, ගම්පහ, කැළණිය හා නුගේගොඩ පොලිස් කොට්ඨාශ 2021 වර්ෂයේදී ද වාර්තා වී තිබුණි. මාරක රිය අනතුරු අවම කිරීමට වේග සීමා ඉක්මවා රිය ධාවනය කරන රියදුරන් හඳුනාගැනීම සඳහා අවශ්‍ය වේග සීමා පරීක්ෂා කිරීමේ උපකරණ 25 ක් 2016 වර්ෂයේදී අවසන් වරට මිලදීගෙන තිබූ අතර එම උපකරණ 05 ක් පමණක් මෙම පොලිස් කොට්ඨාශ පහ වෙත ලබාදී තිබුණි. 2010 හා 2014 වර්ෂයන්හි මිලදී ගෙන තිබූ වේග සීමා උපකරණ ක්‍රියා විරහිත හෝ අළුත්වැඩියා කළ යුතු මට්ටමේ පවතින බැවින් වේග සීමා ඉක්මවා රිය ධාවනය කරන රියදුරන් හඳුනාගැනීමේ කාර්යයට ප්‍රමාණවත් උපකරණ පොලිස් ස්ථාන සතුව නොපැවතුණි. | පිළිතුරු ඉදිරිපත්කර නොතිබුණි. | මාරක හා බරපතල අනතුරු අවම කිරීමටත් ඒ සඳහා අවශ්‍ය පහසුකම් පොලිස් ස්ථාන වෙත ලබා දීමටත් කටයුතු කළ යුතුය. |
| (ඈ) පොලිස් ස්ථානවල රථවාහන රාජකාරී වල නියුතු නිලධාරීන් ප්‍රමාණය 8,772 ක් වූ අතර එයින් රථවාහන කළමනාකරණ පාඨමාලාව හදාරා ඇති නිලධාරීන් සංඛ්‍යාව 2,230 ක් හෙවත් සියයට 25 ක් පමණක් විය. ඒ අතර ශ්‍රී ලංකා පොලීසියේ හදිසි ඇමතුම් අංශය, නාගරික රථවාහන අංශය, අධිවේගී කොට්ඨාශය හා දිසා රථවාහන -බ.ප. උතුර/දකුණ යන කොට්ඨාශයන්හි රථවාහන රාජකාරියේ නියුතු මුළු නිලධාරීන් සංඛ්‍යාව 1,947 ක් වූ අතර ඒ අතරින් 1,791 ක් හෙවත් සියයට 92 | පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. | රථ වාහන රාජකාරියේ නියුතු නිලධාරීන්ට අවශ්‍ය පුහුණුවීම් සිදු කිරීමට කඩිනමින් ක්‍රියා මාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ක් ජ්‍යෙෂ්ඨ /කණිෂ්ඨ රථවාහන කළමනාකරණ පාඨමාලාව හදාරා නොතිබුණි. | | |
| (ඉ) | පොලිස් අභ්‍යාස ආයතන පනතේ V කොටසේ ඇතුලත් 'මුදල්' සම්බන්ධ කටයුතුවලට අදාල "ජාතික පොලිස් අභ්‍යාස ආයතනයේ අරමුදල" පිහිටුවීම හා පනතේ ඊට අදාල 22 සිට 28 දක්වා වූ කාර්යයන් හා කර්තව්‍යයන් සිදුව නොතිබුණි. | අරමුදල පිහිටුවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කර ගැනීමට ඉල්ලීම් කර ඇත. | අරමුදල පිහිටුවා අදාල නියමයන් ප්‍රකාර කටයුතු කළ යුතුය. |

**4. තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම**

---------------------------------------------

| විගණන නිරීක්ෂණය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කල යුතුව පැවති අතර, ශ්‍රී ලංකා පොලීසිය තිරසර සංවර්ධනය අරමුණු 04 ක් යටතේ ඉලක්ක 08 ක් හඳුනාගෙන තිබුණි. පාදක වර්ෂය 2016 යොදාගනිමින් දර්ශකයන් ගොඩනැගීම සිදුකරමින් පැවතියද, තිරසර සංවර්ධන ඉලක්ක කරා ළඟා වීමේදී අදාල කාර්යයන් නියාමනය කිරීම සඳහා අවශ්‍ය වන සංධිස්ථානයන් හඳුනාගෙන නොතිබුණි. | ඉලක්ක හා අරමුණු පිළිබඳ ගැඹුරින් අධ්‍යයනයක් සිදුකළ යුතු බැවින් ඒ සඳහා විද්වත් කමිටුවක් පත්කිරීමට කටයුතු කරගෙන යනු ලැබේ. | අවශ්‍යවන සංධිස්ථානයන් හඳුනාගෙන නියාමනය කළ යුතුය. |

**5.** **මානව සම්පත් කළමනාකරණය කිරීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ

| **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| අ) ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී තනතුර සඳහා අනුමත සංඛ්‍යාව 169 ක්ව පැවතියද, පොලිස් අධිකාරී තනතුර සඳහා අනුමත සංඛ්‍යාව 162 ක් පැවතීම ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී තනතුරට උසස් කිරීමේදී සුදුස්සන් තෝරා ගැනීමට බාධාවක් බව නිරීක්ෂණය විය. | ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී තනතුරට උසස් කිරීමේදී එම තනතුරේ පවතින පුරප්පාඩු ප්‍රමාණයට පමණක් උසස් කිරීම් සිදු කරන බැවින් සුදුස්සන් තෝරා ගැනීමේදී එය බාධාවක් නොවේ. | කාර්යමණ්ඩල ධූරාවලිය විධිමත් අයුරින් සකස්විය යුතුය. |
| ආ) කාන්තා ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී තනතුර සඳහා අනුමත සංඛ්‍යාව 13 ක්ව පැවතියද, කාන්තා පොලිස් අධිකාරී තනතුර සඳහා අනුමත සංඛ්‍යාව 04 ක්ව පැවතීම, කාන්තා ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී තනතුරට උසස් කිරීමේදී සුදුස්සන් තොරාගැනීමට බාධාවක් බව නිරීක්ෂණය විය. | කාන්තා ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී තනතුරට උසස් කිරීමේදී එම තනතුරේ පවතින පුරප්පාඩු ප්‍රමාණයට පමණක් උසස් කිරීම් සිදුකරන බැවින් එය බාධාවක් නොවේ. | අනුමත කාර්ය මණ්ඩල ධූරාවලිය විධිමත් අයුරින් සකස්විය යුතුය. |
| ඇ) පොලිස් කොස්තාපල් තනතුරේ අනුමත සංඛ්‍යාව 60,000 ක් වන නමුත්, පවතින පුරප්පාඩු 27,553 න් දරන්නාට පුද්ගලික වන සේ පොලිස් සැරයන් තනතුරට උසස්කර ඇති අතිරික්ත 10,856 අඩුකල විටද පුරප්පාඩු 16,697 ක් පැවතුණි. 2022 වර්ෂයේදී 3,934 ක් බඳවාගෙන තිබුණි. ඒ අනුව පොලිස් කොස්තාපල් තනතුරේ පුරප්පාඩු ප්‍රතිශතය අනුමත සංඛ්‍යාවෙන් සියයට 18 ක්ව පවතින බැවින් ශ්‍රී ලංකා පොලීසියේ දෛනික රාජකාරී පවත්වාගන යාමට එය බාධාවක් වී තිබුණි. | 2022 වර්ෂයට තුලදී පොලිස් කොස්තාපල් වරුන් 3934 ක් බඳවාගෙන මූලික පුහුණුව ලබමින් සිටී. ඒ අනුව පුරප්පාඩු ප්‍රතිශතය 28% සිට 18% දක්වා අඩුකර ඇත. | පුරප්පාඩු සඳහා බඳවා ගැනීම් නිසි කාලයේදී සිදුවිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| ඇ) | ශ්‍රී ලංකා පොලීසියේ සහායක සේවයේ ජ්‍යෝෂ්ඨ මට්ටමට අයත් නියෝජ්‍ය පොලිස්පති තනතුරු දෙකම සහ ජ්‍යෝෂ්ඨ පොලිස් අධිකාරී, පොලිස් අධිකාරී හා සහකාර පොලිස් අධිකාරී තනතුරු 100 න් 93 ක්ද 2021 දෙසැම්බර් 31 දින වන විට පුරප්පාඩුව පැවතීම මත සහායක සේවයේ ජ්‍යෝෂ්ඨ මට්ටම අක්‍රියව පැවතුණි. | බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටීන් අනුමතකර ඇත. ආධුනික නිලධාරින් බඳවා ගැනීමට කටයුතු සිදු කරමින් පවතී. | සහායක සේවයේ ජ්‍යෝෂ්ඨ මට්ටමේ පත්වීම් නිසි කාලයට සිදුවිය යුතුය. |
| ඉ) | සහායක සේවයේ තෘතියික මට්ටමේ තනතුරු 524 න් 281 ක් ද , ද්විතීක මට්ටමේ තනතුරු 2,296 න් 1,255 ක් ද 2021 දෙසැම්බර් 31 දිනට පුරප්පාඩුව පැවතීම, පොලිස් වෛද්‍ය කොට්ඨාශය, ගොඩනැගිලි කොට්ඨාශ හා තොරතුරු තාක්ෂණ කොට්ඨාශය ඇතුළු කොට්ඨාශ හා පොලිස් ස්ථානයන්හි රාජකාරී කටයුතු පවත්වාගෙන යාමට බාධාවක් වී තිබුණි. | 2022 වර්ෂයේදී තෘතියික මට්ටමේ පුරප්පාඩු 253 ක් දක්වා අඩුකර ඇත. ඉතිරි පුරප්පාඩු සම්පූර්ණ කිරිම සඳහා කටයුතු කරමින් පවතී. | සහායක සේවයේ ද්විතීක හා තෘතියික මට්ටමේ පුරප්පාඩු සඳහා පත්කිරීම් නිසි කාලයට සිදුවිය යුතුය. |
| ඊ) | සිවිල් කාර්ය මණ්ඩලය තුල අනුමත නොවු අනියම්/ තාවකාලික කම්කරු තනතුරේ 13 දෙනෙක් සේවය කරමින් සිටී. | මෙම 13 දෙනාට අදාලව සුදුසුකම් පිළිබඳව දන්වා තනතුර ස්ථිර කිරීම සඳහා රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත ලිපි යවා ඇත. | අනුමත කාර්ය මණ්ඩලය තුලට ඇතුලත් කිරීමේ කටයුතු කඩිනම් විය යුතුය. |